# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

**සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව**

නිෂ්පාදන සහ සේවා කටයුතු වලට අදාල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණයෙහි ප්‍රතිඵල


වැදගත් කරුණු:

- **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය,** 2018 පෙබරවාරි මාසයේ දී වාර්තා වූ 55.6 ක දර්ශක අගයට සාපේක්ෂව, මාර්තු මාසයේ දී මාස 12 කින් වාර්තා වූ ඉහළම අගය වාර්තා කරමින්, 65.6 ක දර්ශක අගයක් වාර්තා කරන ලදී. මෙමගින් නිෂ්පාදන ක්‍රියාකාරකම්වල ඉහළ වර්ධනයක් පෙන්නුම් කරන අතර එය පසුගිය වසරවල පැවති ප්‍රවණතාවන්ටද අනුකූල විය. නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය ඉහළ යෑම කෙරෙහි, නව ඇණවුම් සහ නිෂ්පාදන උපදර්ශකයන්හි ඉහළ යෑම මගින් ද පෙන්නුම් කළ පරිදි, උත්සව සමයෙහි ඇතිවන ඉල්ලුමෙහි වර්ධනය හේතු විය. ගැනුම් තොග සහ සේවා නියුක්තිය යන උපදර්ශක ද පසුගිය මාසයට සාපේක්ෂව ඉහළ යන ලදී. තවද, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය යන උපදර්ශකය ඉහළ යෑමද, සමස්ථ දර්ශකයේ ඉහළ යෑම සඳහා ධනාත්මකව බලපාන ලදී. කෙසේ වුවද, බොහොමයක් ප්‍රතිචාර දක්වන්නන්, විශේෂයෙන්ම රෙදිපිළි සහ නිමි ඇඳුම් අංශයේ, පුහුණු සහ නුපුහුණු ශ්‍රමිකයන් සොයාගැනීම අපහසු කටයුත්තක් බව සඳහන් කරන ලදී. එසේ වුවද, ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයෙහි සියලුම උපදර්ශක කඩඉම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50.0 ට වඩා වැඩි අගයක් වාර්තා කරමින්, 2018 මාර්තු මාසයේ දී සමස්ථයක් ලෙස නිෂ්පාදන ක්‍රියාකාරකම්හි වර්ධනයක් පිළිඹිබු කරන ලදී. තවද, ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් ද යහපත් බව පෙන්නුම් කරයි.


- **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය,** 2018 පෙබරවාරි මාසයේ දී වාර්තා වූ 58.4 ක දර්ශක අගයට සාපේක්ෂව මාර්තු මාසයේ දී 58.0 ක දර්ශක අගයක් වාර්තා කරන ලදී. නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම්, සේවා නියුක්තිය සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම් යන උපදර්ශකවල දායකත්වයෙන් 2018 මාර්තු මාසයේ දී සේවා අංශය, අඩු වේගයකින් වුව ද, වර්ධනය වූ බව මෙමගින් පෙන්නුම් කෙරෙයි. මූල්‍ය සේවා, රක්ෂණ සහ තොග සහ සිල්ලර වෙළඳාම යන අංශවල නව ව්‍යාපාර වර්ධනය ඉහළ මට්ටමක පැවති බව දක්නට ලැබිණි. සාමාන්‍යයෙන් පෙබරවාරි මාසයට සාපේක්ෂව මාර්තු මාසයේ දී ව්‍යාපාර ක්‍රියාකාරකම්වල සෘතුමය ඉහළ යෑමක් දක්නට ලැබුණ ද ව්‍යාපාර ක්‍රියාකාරකම් අඩු වේගයකින් වර්ධනය වීම මෙවර සමීක්ෂණයෙහි දක්නට ලැබුණු විශේෂ ප්‍රවණතාවයකි. ව්‍යාපාර ක්‍රියාකාරකම්හි මෙම මධ්‍යස්ථ වර්ධනය විශේෂයෙන්ම නවතැන් සහ ආහාරපාන සැපයීමේ සේවා, ප්‍රවාහන සහ තොග සහ සිල්ලර වෙළඳාම යන අංශවල දක්නට ලැබිණි. රටේ විවිධ ප්‍රදේශවල පැවති ජනවාර්ගික නොසන්සුන්තා 2018 මාර්තු මාසයේ දී ව්‍යාපාර ක්‍රියාකාරකම්වලට බලපෑ බව සමීක්ෂණයට ප්‍රතිචාර දක්වන්නන් ප්‍රකාශ කරන ලදී. පෙර මාසයේ දී දක්නට ලැබුණු උපනතිය අඛණ්ඩව ඉදිරියට ගෙනයමින්, සේවා නියුක්තිය ඉහළ යෑම මධ්‍යයේ, 2018 මාර්තු මාසයේ දී නිම කිරීමට ඇති කාර්යයන් පහළ ගිය අතර අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම්වල මධ්‍යස්ථ වර්ධනයක් දක්නට ලැබිණි. ඉදිරි කාලයේ දී ඇතිවිය හැකි වැටුප් වර්ධන සහ උත්සව සමයේ ලබාදෙන දිරිදීමනා හේතුවෙන් අපේක්ෂිත ශ්‍රම පිරිවැය ඉහළ ගිය අතර, සේවා අංශයේ අය කරන මිල ගණන් අඩු වේගයකින් ඉහළ ගියේය.

| | ව\මා | ජන. | පෙබ. | මාර්. | අප්‍රේ. | මැයි | ජුනි | ජූලි | අගෝ. | සැප්. | ඔක්. | නොවැ. | දෙසැ. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **2015** | n.a. | n.a. | n.a. | n.a. | 67.3 | 57.5 | 55.5 | 56.5 | 53.2 | 57.8 | 54.8 | 57.9 |
| | **2016** | 51.9 | 55.3 | 60.7 | 41.6 | 47.9 | 55.1 | 50.6 | 53.5 | 57.7 | 56.5 | 58.4 | 58.3 |
| | **2017** | 56.2 | 57.1 | 66.5 | 41.8 | 57.9 | 56.1 | 54.3 | 54.4 | 59.0 | 54.8 | 58.8 | 59.1 |
| | **2018** | 51.7 | 55.6 | **65.6** | - | - | - | - | - | - | - | - | - |
| **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **2015** | n.a. | n.a. | n.a. | n.a. | 66.8 | 65.0 | 60.6 | 59.8 | 61.7 | 59.5 | 59.3 | 60.2 |
| | **2016** | 58.0 | 59.3 | 61.6 | 54.7 | 58.1 | 56.3 | 57.8 | 61.2 | 57.7 | 59.3 | 59.7 | 59.8 |
| | **2017** | 57.5 | 57.3 | 60.8 | 54.2 | 55.3 | 59.2 | 59.1 | 60.1 | 57.0 | 55.3 | 57.4 | 61.2 |
| | **2018** | 56.6 | 58.4 | **58.0** | - | - | - | - | - | - | - | - | - |

## නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




## සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

තාක්ෂණික සටහන:

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව අවම වශයෙන් ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍යය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.